# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2315/27 - 2023 ජනවාරි මස 18 වැනි බදාදා - 2023.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)
76 අ වගන්තිය යටතේ නියමය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 39ආ වගන්තියේ දැක්වෙන කරුණුවලට අමතරව තැපැල් ඡන්දදායකයෙකු වශයෙන් සලකණු ලැබීම පිණිස ඡන්ද විමසීම සඳහා ඔවුන්ගේ කාර්යයන් අත්‍යවශ්‍යව පවතින බැවින් හා ඡන්ද විමසීම් දිනයේ දී අත්‍යවශ්‍ය රාජකාරිවල සේවයේ නියුක්ත කරවීමට අපේක්ෂිත මතු දක්වා ඇති උපලේඛනයේ සඳහන් ආයතනවල සීමිත නිලධාරීන් හා සේවක පිරිස ඇතුළත් කිරීමට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 76අ වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එස්. බී. දිවාරත්න,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. එම්. මොහමඩ්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

කේ. පී. පී. පතිරණ,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

පී. එස්. එම්. චාල්ස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2023 ජනවාරි මස 18 වැනි දින,
සරණ මාවත, රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.


1A - G 38621 — 16 (2023/01)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මහවැලි ආරක්ෂක බලකාය මගින් පැය 24 පුරා ආවරණයවන සේ ආරක්ෂාව සපයනු ලබන වික්ටෝරියා ජලාශය, පොල්ගොල්ල ජලාශය, රන්දෙණිගල ජලාශය, කොත්මලේ ජලාශය, කලා වැව, උඩවලව ජලාශය, බෝවතැන්න ජලාශය, මාදුරුඔය ජලාශය, උල්හිටිය/ රත්කිඳ ජලාශය, කළුගඟ ජලාශය, දඹුලුඔය, කණ්ඩලම, මොරගහකන්ද ජලාශය, බදුළුඔය ජල පැන්නුම යන ජලාශ/ වේලි හා ස්ථානවල රාජකාරි සඳහා යොදවනු ලබන සේවකයින් ;

2. ලංකා විදුලිබල මණ්ඩලය විසින් පැය 24 පුරා අඛණ්ඩව පවත්වාගෙන යායුතු කොළඹ නගරයේ ආර්ථික මර්මස්ථානවන වරාය හා ප්‍රභූ නිල නිවාස, ප්‍රධාන රාජ්‍ය ආයතන, ප්‍රධාන මාධ්‍ය ආයතනවන රූපවාහිනී සංස්ථාව, ගුවන් විදුලි සංස්ථාව හා ඡන්ද විමසීම හා ගණන් කිරීම සිදුකරනු ලබන මධ්‍යස්ථානවල සේවා සැපයිය යුතු බැවින් එම අත්‍යවශ්‍ය සේවාව ඉටුකරන ලංකා විදුලිබල මණ්ඩලයේ බලාගාර, හුවමාරු හා නඩත්තු මධ්‍යස්ථාන සේවකයින්;

3. මාර්ග සංවර්ධන අධිකාරියේ පැය 24 පුරා අඛණ්ඩව සේවා පවත්වාගෙන යායුතු අධිවේගී මාර්ග පිවිසුම් හා නඩත්තු අංශයන් හි සේවා නියුක්ත සේවකයින්;

4. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පැය 24 පුරා අඛණ්ඩ සේවා පවත්වාගෙන යායුතු ඇමතුම් මධ්‍යස්ථානවල සේවය කරන සේවකයින්;

5. සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් සමාගමේ ඉන්ධන ගබඩා පිහිටි කොලොන්නාව, මුතුරාජවෙල ආරක්ෂක රාජකාරි ඉටුකරන සේවා නියුක්ත සේවකයින්;

6. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ඡන්ද විමසීම් දින විකාශන කටයුතු සඳහා සම්බන්ධවන සේවකයින්;

7. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්; වේ.

EOG 01 - 0192

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.